**ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) - 2020**
**-------------------------------------------------------------------------**

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යයනය) **2020** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක 2767 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
**-------------------------------------------------------------------------**

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ගවල කිලෝමීටර් 62ක් වැඩිදියුණු කිරීම, පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම් මගින් ජාතික ප්‍රවාහන පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,728කට සමාන එ.ජ.ඩො. මිලියන 105.60ක් වන අතර ඉන් රු. මිලියන 11,050කට සමාන එ.ජ.ඩො මිලියන 85ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් **14** දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් දිනට නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය **2020** දෙසැම්බර් **31** වන විටත් එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකර තිබුණි.

**1.3** මතය
**-------**

ව්‍යාපෘතියේ **2020** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම
**--------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

----------------------------

## 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

-----------------------------------------------------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, හික්කඩුවෙන් සහ අළුත්ගමින් දක්ෂිණ අධිවේගී මාර්ගයට සෘජුවම සම්බන්ධවන ජාතික මාර්ග 2ක් සහ මාතර - ගොඩගම මාර්ගය, කටුකුරුන්ද - නාගොඩ මාර්ගය, කිරුළපන-ගොඩගම මාර්ගය හා පාමංකඩ - කැස්බෑව මාර්ගය යන වෙනත් ජාතික මාර්ග 4ක

කිලෝමීටර් 62ක් වැඩිදියුණු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ යලි සම්බන්ධ කිරීමට සැලසුම් කරන ලදී. කෙසේවෙතත්, 2016 දෙසැම්බර් 31 වන විටත් එම මාර්ගවල කිලෝමීටර් 58.96ක් පුනරුත්ථාපන කටයුතු නිමකර තිබුණි. මාතර - ගොඩගම මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඉලක්කගත කාලය තුල නිමකර තිබුණු අතර ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් අනෙකුත් මාර්ගයන් දින 172 සිට දින 338 ප්‍රමාදයන් සහිතව නිමකර තිබුණි.

**2.2** පරිබාහිර ගනුදෙනු

---------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය දකුණු පළාතේ ගාල්ල- බද්දේගම මාර්ගයේ කිලෝමීටර 17.6ක් පුනරුත්ථාපනය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් එකතුව රු. මිලියන 18.33ක් වියදම් කර තිබුණද ඒ සම්බන්ධ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මාර්ගයේ අදාළ කොටසේ පුනරුත්ථාපන කටයුතු සිදු කර නොතිබුණි. | සියලුම කොන්ත්‍රාත් පැකේජ 07 (සීපී 1-සීපී 07) නිමකිරීමට ණය මුදල ප්‍රමාණවත් නොවීය. එම නිසා, මෙම ණය මුදල යටතේ ගාල්ල- බද්දේගම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ විෂය පථයට අනුගතවීම අවශ්‍ය වේ. |

**2.3** ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ගැටලු

-----------------------------------------------

| විගණන ගැටලුව | කළමනාකාරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලබා දී ඇති තොරතුරු අනුව, රජයේ ඉඩම් කොටස් 1,362 ක් ඇතුළුව ඉඩම් කොටස් 7,632ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 5,741ක් සඳහා වන්දි ගෙවීම ප්‍රමාදවීම මත පොළිය ඇතුලුව රු. මිලියන 7,158ක වන්දි මුදලක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය 1986 අංක 13 දරන ඉඩම් අත්පත් කරගැනීමේ හා නිරවුල් කිරීමේ පනතේ 44වන වගන්තිය යටතේ 2020 දෙසැම්බර් 31 දිනට කිසිදු ඉඩම් කොටසක අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. තවද, ව්‍යාපෘතියේ ඉතිරි ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු පිරිවැය ඇස්තමේතුවක් පිළියෙල කිරීමකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරුකර තිබුණි. | 44 වන වගන්තිය යටතේ නිකුත් කිරීම් ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර පොළිය ගෙවීම් දක්වා ගෙවා ඇත.<br>ඉතිරි ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරුකර ඇති අතර ඒ සඳහා පිරිවැය ඇස්තමේතුව පිළියෙල කරමින් පවතී. ඉහත පිරිවැය ඇස්තමෙන්තුව 2021 නොවැම්බර් අවසන් වීමට පෙර ඉදිරිපත් කරනු ලැබේ. | ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධව කඩිනම් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. |

**2.4** ඌන උපයෝජිත සම්පත්

-----------------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සිවිල් ඉදිකිරීම් කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ණය නියෝජිත ආයතනය මගින් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 7.20ක් නියෝජනය කරන රු. මිලියන 923කට සමාන එ.ජ.ඩො. මිලියන 6.12ක ප්‍රතිපාදන ව්‍යාපෘති කාලය අවසාන වන විටදී උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණු අතර අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීමකින් තොරව 2017 සැප්තැම්බර් 11 දින ණය නියෝජිත ආයතනය වෙත ප්‍රේෂණය කර තිබුණි. | සියලුම කොන්ත්‍රාත් පැකේජ 07 (සීපී 1-සීපී 07) නිමකිරීමට ණය මුදල ප්‍රමාණවත් නොවීය. | ව්‍යාපෘති කාලසීමාව තුළදී කටයුතු සම්පූර්ණ කිරීමට හැකිවන ආකාරයට ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |